බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු
සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය.
மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார, மற்றும்
தகவல் தொழில்நுட்பவியல் அமைச்சு.
Ministry of Education, Cultural and arts, Sports and Youth affairs and
Information Technology - Western Province

2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල.
2 வது மாடி, புதிய மாகாண சபை அலுவலக வளாகம்,
204, டென்ஸில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
2nd Floor, New Provincial Office Complex,
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

මගේ අංකය / எனது இலக்கம் / My Ref. 5/5/9-2021

ඔබේ අංකය / உனது இலக்கம் / Your Ref.

දිනය / திகதி / Date 2021.08.

**බස්නාහිර පළාත් නිවේදක වැඩමුළුව හා තරගාවලිය 2021**
**බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය මඟින් පවත්වන කලා උළෙලට සමගාමීව කණිෂ්ඨ,ජ්‍යෙෂ්ඨ හා විවෘත යන අංශයන්ගෙන් යුක්තව නිවේදක තරගාවලියක් පැවැත්වීමට සැළසුම් කර ඇති අතර ඒ අනුව පහත සඳහන් උපදෙස් හා කොන්දේසි අනුව උක්ත තරගාවලිය වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තරග කොන්දේසි

1. මේ සඳහා සහභාගී විය හැක්කේ බස්නාහිර පළාතේ පදිංචිකරුවන් සඳහා පමණී.

2. මෙම තරගාවලිය පහත සඳහන් වයස් කාණ්ඩ තුන යටතේ ක්‍රියාත්මක වේ.

   - කණිෂ්ඨ අංශය - පාසල් 06 ශ්‍රේණිය සිට 09 ශ්‍රේණිය දක්වා
   - ජ්‍යෙෂ්ඨ අංශය - පාසල් 10 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා
   - විවෘත අංශය - වයස අවුරුදු 16 සිට 35 දක්වා (මෙහිදී පාසල් හැර ගිය ඉල්ලුම්කරුවන් සලකා බලනු ලැබේ.)

3. පාසල් අයදුම්කරුවෙක් නම් විදුහල්පති හෝ ග්‍රාමනිලධාරි විසින් ද ,විවෘත අයදුම්කරුවන් ග්‍රාම නිලධාරී විසින් ද සහතික කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

4. විවෘත අංශය සඳහා පාසල් ගුරු මහත්ම මහත්මීන්ට ද සහභාගී විය හැක.

5. සෑම තරගකරුවෙක්ම තරග සඳහා ඉදිරිපත්වීමේදී තම අනන්‍යතාවය සනාථ කළ යුතුය.ඒ සඳහා ජාතික හැඳුනුම්පත/ තැපැල් හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය/ වලංගු රියදුරු බලපත්‍රය හෝ උප්පැන්න සහතිකයේ පිටපතක් සමඟ ග්‍රාම නිලධාරී/ විදුහල්පති/ විහාරාධිපති හෝ රජයේ පිළිගත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය.



| | කාර්යාලය அலுவலகம் Office | ලේකම් செயலாளர் Secretary | ගිණුම් கணக்குகள் Accounts | සැළසුම් திட்டமிடல் Planning | ක්‍රීඩා விளையாட்டு Sports | සංස්කෘතික கலாசாரம் Cultural |
|---|---|---|---|---|---|---|
| දුරකතන/ தொலைபேசி /Phone | 0112 092883<br>0112 093075 | 0112 092873 | 0112 092881<br>0112 093068 | 0112 092869<br>0112 093135 | 0112 092887<br>0112 093097 | 0112 092875<br>0112 093105 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 0112 092894 | 0112 092874 | 0112 092880 | 0112 092894 | 0112 092888 | 0112 092894 |
| ඊ මේල් / E-mail / | Moe.wp.gov@gmail.com | | | | | |

6. තරග සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

7. නිවේදක තරග සඳහා නිශ්චිත කාලයක් තුළදී තමන් කැමති නිවේදන අංගයක් ඉදිරිපත් කිරීම, ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම, විනිශ්චය මණ්ඩලය විසින් ලබාදෙන සජීවී විස්තර කථනයක් ඉදිරිපත් කිරීම, වෙළෙඳ දැන්වීම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය මණ්ඩලයේ තීරණය පරිදි ලබාදෙන ඉදිරිපත් කිරීමක් ද ආදිය ඇතුලත් වේ.

8. දිස්ත්‍රික් මට්ටමින් තරග පවත්වා තෝරාගනු ලබන තරගකරුවන් 100 දෙනෙකු සඳහා නිවේදන වැඩමුළුවක් පවත්වා, පළාත් තරගය වෙත ඉදිරිපත් කර ජයග්‍රාහකයන් තෝරාගනු ලැබේ.

9. ජයග්‍රාහකයින් සඳහා සම්මාන, සහතික පත්‍ර හා මුල්‍ය ත්‍යාග පිරිනමනු ලැබේ.

10. තරගයට අදාල සියළු ක්‍රියාකාරකම් සෞඛ්‍ය නීති රීති හා මාර්ගෝපදේශයන්ට අනුකූලව පැවැත්වේ.

- අයදුම්පත් යොමු කිරීමේදී අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ **බස්නාහිර පළාත් නිවේදන තරගාවලිය 2021** යනුවෙන් සඳහන් කළ යුතුයි.

- **අයදුම්පත් 2021.10.10** දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුයි. තවද, අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසන් දිනට තරගකරුවන් විසින් නියමිත වයස සම්පූර්ණ කර තිබිය යුතුය.

**ලේකම්,**
**බස්නාහිර පළාත් අධ්‍යාපන,සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,**
**204,**
**02 වන මහල,**
**නව පළාත් සභා සංකීර්ණය,**
**ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

විමසීම් : ජේ.ඒ.කේ.එස්.ජයසූරිය මිය - 0714415349
එම්.ඩී.ඒ.ඩබ්ලිව්. ඉයුනිල් මිය - 0766255018

- වැඩිදුර තරග විස්තර සඳහා ඉහත සංස්කෘතික නිලධාරීන් සම්බන්ධ කර ගත හැක.

**සිරිසෝම ලොකුවිතාන**
**ලේකම්,**
**අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)**